ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1984 අංක 18 දරන

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 1984 මැයි මස 02 දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 මැයි මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.**

**මිළ : රු. 1.20 යි.** **තැපැල් ගාස්තුව : ශත 60 යි.**

# 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1984 මැයි මස 02 වන දින]

එල්. ඩී.—ඕ. 14/83

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

## I වන කොටස

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පිහිටුවීම, එහි අරමුණු, බලතල සහ කර්තව්‍ය

2. (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. — ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් ආයතනයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ස්වකීය සංස්ථා නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද, ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) පාලක මණ්ඩලයේ සාමාජිකයන් ආයතනයේ සාමාජිකයන් විය යුතු ය

3. ආයතනයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා තිබිය යුතු ය. — ආයතනයේ ප්‍රධාන කාර්යාලය.

4. (අ) ශිල්පීය ක්‍රම, කාර්යාවලි, අමුද්‍රව්‍ය උපයෝගිතාව, ක්‍රම සම්පාදනය ආදිය දියුණු කිරීමේ අරමුණ ඇතිව සහ එමගින් ශ්‍රී ලංකාවේ මුද්‍රණ ආයතනවල මුද්‍රණය කිරීමේ තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස මුද්‍රණ කර්මාන්තයෙහි දැනට සේවයෙහි නියුක්ත තැනැත්තන් පුහුණු කිරීම ; — ආයතනයේ සාමාන්‍ය අරමුණු.

(ආ) මුද්‍රණ තාක්ෂණ විද්‍යාව සහ කළමනාකරණය ක්ෂේත්‍රයන්හි පුහුණු වීමේ පාඨමාලා සංවිධානය කිරීම ;

(ඇ) ආයතනය විසින් පවත්වනු ලබන පුහුණුවීමේ පාඨමාලා සම්බන්ධයෙන් සහතික පත්‍ර සහ අභිඥාන පත්‍ර ප්‍රදානය කිරීම ;

(ඈ) නව විෂයමාලා, ශිල්පී ක්‍රම, කාර්යාවලි සහ ලබාගත හැකි අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් මුද්‍රණ කර්මාන්තයෙහි නිරතව සිටින තැනැත්තන්ට වාර ප්‍රවෘත්ති පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් මගින් තොරතුරු සංවිධානය කිරීම සහ බෙදා හැරීම;

(ඉ) මුද්‍රණ පාසැල්වල හෝ මුද්‍රණ ආයතනවල එතෙර පුහුණු වීම සමාරම්භ කිරීම සහ හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් මගින් ප්‍රති පුහුණුව අන්‍යොන්‍ය වශයෙන් ලබා දීම හා ලැබීම;

(ඊ) ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය සඳහා අවශ්‍ය අලුත් ශිල්පී ක්‍රම සහ තොරතුරු අත්කර ගැනීමේ අරමුණ ඇතිව, මුද්‍රණ කර්මාන්තයට සම්බන්ධ වෘත්තීය ප්‍රදර්ශනවලට යෑම සහ සහභාගී වීම;

(උ) ශ්‍රී ලංකාවෙහි ලබාගත හැකි මුද්‍රණ ක්‍රම නොපවත්නා අසල්වැසි රටවල මුද්‍රණ කර්මාන්තයෙහි දැනටමත් සේවයෙහි නියුක්ත තැනැත්තන් පුහුණු කිරීම

ආයතනයේ සාමාන්‍ය අරමුණු විය යුතු ය.

ආයතනයේ බලතල.

5. ස්වකීය අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන්—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදානයන්, ත්‍යාග සහ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, ගැනීම හෝ දීම, බදු දීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) සේවක පිරිස් සහ ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීම සඳහා සහ සාමාන්‍යයෙන් තම පොදු අරමුණුවලට හිතකර කාර්ය සඳහා, සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ආයතනයේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ ශ්‍රී ලංකාවේ වුවද එතෙර වුවද ඇති අධ්‍යාපන හෝ වෙනත් ආයතන සමග සහයෝගතාවය සඳහා ගිවිසුම්වලට එළඹීම;

(ඈ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා උපකරණ, අරමුදල්, සේවක පිරිස් සහ වෙනත් යම් සහාය භාර ගැනීම;

(ඉ) මහාචාර්ය ධුර, සාමාජික ධුර, පර්යේෂණ අධි ශිෂ්‍ය ධුර, ඇති කිරීම සහ, මූලික සහ උසස් අධ්‍යයන කටයුතු සඳහා ත්‍යාග සහ පදක්කම් ප්‍රදානය කිරීම;

(ඊ) පුස්තකාල සහ පර්යේෂණාගාර ඉදි කිරීම, උපකරණ සැපයීම සහ ඒවා නඩත්තු කිරීම සහ මූලික සහ උසස් අධ්‍යයන කටයුතු සඳහා වෙනත් සේවාවන් සැලැස්වීම;

(උ) ස්වකීය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, ඔවුන්ගේ හැසිරීම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළු නිලධරයන් සහ සේවකයන් සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඌ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ;

(එ) ආයතනය විසින් කරන ලද යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අයකිරීම් නියම කිරීම ;

(ඒ) ආයතනයට කරන ලද යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අයකිරීම් ගෙවීම ;

(ඔ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන හෝ ඊට ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම

සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන්නා වූ බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍ය ආයතනයට තිබිය යුතු ය.

**6.** ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය අරමුණු ක්‍රියාවේ යෙදවීමේ දී ආයතනය විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්තියට සහ ඒ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානයකට අනුකූලව කටයුතු කළ යුතු ය. ආයතනය විසින් අමාත්‍යවරයාගේ විධාන යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

**7.** (1) ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු ය. පාලක මණ්ඩලය.

(2) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) අමාත්‍යවරයාගේ මතය අනුව මුද්‍රණ තාක්ෂණ විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයෙහි ක්‍රියාශීලීව නිරතව සිටින්නා වූ ද අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නාවූ ද (මෙහි මින් මතු "පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් පස් දෙනකු ;

(ආ) (i) ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිවරයා ;

(ii) රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ සභාපතිවරයා ;

(iii) සමස්ත ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමයේ සභාපතිවරයා ;

(iv) ශ්‍රී ලංකා ඇසුරුම් ද්‍රව්‍ය ආයතනයේ සභාපතිවරයා

වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තන් විය යුතු ("නිල වශයෙන් සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් සාමාජිකයන් හතර දෙනකු.

සාමාජිකත්වය සඳහා නුසුදුසු වීම.

8. තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නම් හෝ එලෙස වුවහොත්; හෝ

(ආ) මුද්‍රණ තාක්ෂණ විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳ දැනීම බෙදා හැරීම සම්බන්ධයෙන් ආයතනය විසින් හෝ ඒ වෙනුවෙන් වූ යම් ගිවිසුමක් නොවන වෙනත් යම් ගිවිසුමක් යටතේ වූ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් ඔහු විසින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් කරනු ලබන්නේ නම් හෝ භුක්ති විඳිනු ලබන්නේ නම්; හෝ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තමා විසින් තම කර්තව්‍ය ඉටු කිරීමට හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ නොකඩව කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන්ගේ ධුර කාලය.

9. (1) මියයාමෙන්, අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කළහොත් මිස, මණ්ඩලයේ පත් කරන ලද සෑම සාමාජිකයකුම, අවුරුදු තුනක කාලයක් ස්වකීය ධුරය දැරිය යුතු ය.

(2) (අ) පත් කරන ලද යම් සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, කිසිදු හේතුවක් නොදක්වා වුවද එසේ ඉවත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ යම් සාමාජිකයකු ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ පත් කරන ලද යම් සාමාජිකයකු විසින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, කවර අවස්ථාවක දී වුව ද ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකු මියගියහොත්, හෝ ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, 7 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, එසේ මියගිය, ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයකු ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස තුළ ධුරය දැරිය යුතු ය.

(6) රෝගාතුරවීම නිසා හෝ අබලතාවට පත්වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව

නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 7 වන වගන්තියෙහි විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) ඉවත් කරනු ලැබීමෙන් හැර අන්‍යාකාරයකින් තම ධුරය හිස් කරන මණ්ඩලයේ යම් පත් කරන ලද සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

**10.** මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

**11.** මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්, ආයතනයේ කිසිම ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ආයතනයේ ක්‍රියා හෝ කටයුතු නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතු බව.

**12.** මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් සහ අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම.

**13.** ආයතනයේ මුද්‍රාව—

ආයතනයේ මුද්‍රාව.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; තවද

(ඇ) මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ තමන් පැමිණ සිටි බවට, සාධකයක් වශයෙන් යම් ලියවිල්ලකට අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර ඒ ලියවිල්ල මත නොතැබිය යුතු ය.

**14.** (1) මණ්ඩලයේ රැස්වීම් සෑම මාසයකදීම යටත් පිරිසෙයින් එක් වරක්වත් පැවැත්විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

(2) සභාපතිවරයා විසින් එක් එක් සාමාජිකයා වෙත මණ්ඩලයේ සෑම රැස්වීමක් පිළිබඳව යටත් පිරිසෙයින් දින හතක ලිඛිත දැන්වීමක් දිය යුතු අතර, ඒ රැස්වීමේ දී කරනු ලබන කටයුතු ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් දෙදෙනකු විසින් විශේෂ රැස්වීමක් කැඳවන ලෙස ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුවහොත් ඒ ඉල්ලීමට පසු දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් පස් දෙනකු සිටිය යුතු ය.

(5) තමා පැමිණ සිටින මණ්ඩලයේ සෑම රැස්වීමකදීම මණ්ඩලයේ සභාපතිවරයා මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක දී සභාපතිවරයා පැමිණ නොසිටියහොත්, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරනු ලබන යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය ගත යුතු ය.

(6) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව ඡන්ද සංඛ්‍යාවල සමානත්වයක් ඇති අවස්ථාවක ඒ රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(7) මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වලදී කටයුතු කිරීම් සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම.

15. (1) මණ්ඩලය විසින් ස්වකීය බලතල, කර්තව්‍ය සහ කාර්ය කිසිවක් සභාපතිවරයා වෙත හෝ ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ පවරා දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය කිසිවක් පවරනු ලැබූ සභාපතිවරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව, එසේ පවරනු ලැබූ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.

16. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය—

(අ) ආයතනයේ පරිපාලනය සඳහා අරමුදල් රැස්කිරීම සහ ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍යාධාර දේශීය මෙන්ම විදේශීය සංවිධානවලින් සහ අනුයෝජිත ආයතනවලින් ලබා ගැනීම ;

(ආ) මණ්ඩලය විසින් සලසන ලද යම් සේවාවන් හෝ පහසුකම් සඳහා ගාස්තු අය කිරීම ;

(ඇ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා මාර්ග ගැනීම ;

(ඈ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

## II වන කොටස

### ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා සහ ආයතනයේ වෙනත් නිලධරයන් සහ සේවකයන් පත්කිරීම

**17.** (1) මණ්ඩලය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට, (මෙහි මින් මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය හැකි අතර, ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා පත්කිරීම.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඔහු වෙත පවරනු ලබන යම් බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර්වරයා, මණ්ඩලය විසින්, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) රෙජිස්ට්‍රාර්වරයාගේ පාරිශ්‍රමිකය ඇතුළුව සේවා නියුක්තිය පිළිබඳ කොන්දේසි, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**18.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්— ආයතනයේ කාර්ය මණ්ඩලයට පත්කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

(අ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය වියහැකි වෙනත් නිලධරයන් සහ සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය ;

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය ;

(ඇ) කාර්ය මණ්ඩලයේ වේතන සහ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම් කරනු ලැබිය හැකි ය ;

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කරනු ලැබිය හැකිය ; තවද

(ඉ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවීම සහ විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සියලු කාරණා සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

**19.** මණ්ඩලයේ අනුමතය ඇතිව, රෙජිස්ට්‍රාර්වරයා විසින්, ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය නිශ්චය කරනු ලැබිය යුතු ය. කාර්ය නිශ්චය කිරීම.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**20.** (1) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩලයේ සාමාජිකයන් එකඟ වන අර්ථ සාධක අරමුදල්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු නියම සහ කොන්දේසි මත ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකි ය.

(5) නියමිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟවී ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක් වේ නම් එය ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මුදල්

ආයතනයේ අරමුදල.

**21.** (1) ආයතනයට ආයතනයේම අරමුදලක් තිබිය යුතු අතර, ආයතනය විසින් එය පවත්වාගෙන යා යුතු ය.

(2) ආයතනයේ අරමුදලට—

(අ) ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් ප්‍රවේදිතාවක් ඇත්තා වූ සංවිධාන විසින් සපයනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කිරීමේ දී සහ කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර වූ හෝ යම් ප්‍රභවයකින් ආදායම, ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානයන් වශයෙන් ආයතනයට ලැබිය හැකි සියලු මුදල්

බැර කළ යුතු ය.

(3) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සම්බන්ධයෙන් ආයතනය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනය ධන බද්ද ගෙවීමෙන් නිදහස් වන බව.

22. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ධන බද්දක් ගෙවීමෙන් ආයතනය නිදහස් වන්නේ ය.

ආයතනයේ අරමුදල් ආයෝජනය කිරීම.

23. මණ්ඩලයේ කටයුතුවල කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන ආයතනයේ යම් අරමුදල් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලේ මුදල් ආපසු ගැනීම සහ ආයෝජනය කිරීම.

24. ආයතනයේ අරමුදලින් යම් මුදල් ආපසු ගැනීමේ සහ අරමුදලේ යම් මුදල් ආයෝජනය කිරීමේ පිළිවෙළ හා ආකාරය තත්කාර්යය සඳහා කලින් කල සාදනු ලබන යම් රීතිවලට අනුකූලව මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු අතර, ඒ රීතිවලට අනුකූලව හැර, කිසිම මුදලක් ආපසු නොගත යුතු ය.

මුදල් වර්ෂය සහ මණ්ඩලයේ මුදල් විගණනය කිරීම.

25. (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආයතනයේ ආදායම හා වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු කටයුතු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීම මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

ආයතනයේ සාමාජිකයන් සහ සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

26. දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ආයතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

27. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව තේරුම් ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා, ඒවා ලබාගත හැකිය.